# චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය හා යහපාලනය (Good Governance) ගොඩ නැගීම සඳහා එහි උපයෝගිතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

An investigative study on the concept of the Chakravarti State (Universal Monarchy) and its utility for building Good Governance

ආචාර්ය පනාමුරේ චන්දිම හිමි

## Abstract

From the very beginning, the man has realized that being under a ruler had made life easier. In India as well as in many countries where the Indian culture is prevalent, the idea of state domination often takes a religious form. Investigating what the concept of the Chakravarti kingdom (Universal Monarchy) in Buddhist philosophy and the prevailing views on it, the focus here is on how the concept of the Universal Monarchy can be used to build good governance.This research examines the concepts included in the Tripitaka and commentaries on the Universal Monarchy and its relevance on the concept of good governance which is widely discussed in the world today to make it a reality, and is expected to focus on how this concept can be used to build a better political culture.Keywords : Chakravarti Kingdom, Good Governance, State Governance, Ruler, The Controlled, Politics

**Keywords:** Concept of the Chakravatti, Good Governance, State, Political Controller.

**සාරසංක්ෂේපය**

මානවයාගේ ආරම්භයේ සිටම පාලකයෙකු යටතේ සිටීම ජීවත් වීමට පහසු මගක් බව මිනිසා අවබෝධ කර ගත් කරුණකි. භාරතයේ මෙන් ම භාරතීය සංස්කෘතිය පැතිරී ගිය බොහෝ රටවල රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ අදහස බොහෝ විට ආගමික ස්වරූපයක් ගනු ලබයි. බෞද්ධ දර්ශනයට අනුව චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය යනු කුමක් ද යන්න හා ඒ පිළිබඳ පවත්නා මතවාද පිළිබඳ විමර්ශනය කරමින් යහපාලනය (Good Governance) ගොඩ නැගීම සඳහා සක්විති රාජ්‍ය සංකල්පය උපයෝගී කර ගත හැකි ආකාරය පිළිබඳ මෙහිදී අවධානය යොමු කෙරේ.

වර්තමාන ලෝකයේ බොහෝ සෙයින් සාකච්ඡාවට බඳුන්වන යහපාලනය නම් සංකල්පය යථාර්ථයක් කරණු පිණිස ත්‍රිපිටකාගත හා අටුවා ටීකා ග්‍රන්ථවල ඇතුළත් සංකල්ප විමර්ශනය කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කෙරේ. යහපත් දේශපාලන සංස්කෘතියක් ගොඩ නැගීම සඳහා මෙම සංකල්පය පාදක කරගත හැකි ආකාරය පිළිබඳ අවධානය යොමු කරමින් පර්යේෂණය කිරීමට අපේක්ෂා කෙරේ.

**යතුරු පද:** චක්‍රවර්ති සංකල්පය, යහපාලනය, රාජ්‍ය පාලනය, පාලක, පාලිත, දේශපාලනය

**හැඳින්වීම**

ලෝක සත්ත්වයාගේ හිත සුව පිණිස ලොව පහළවන පුද්ගලයන් දෙදෙනෙකු පිළිබඳ අංගුත්තර නිකායේ දුක නිපාතයේ සඳහන් වෙයි. (අං.නි.දුක නිපාතය 123) එහි සඳහන් ආකාරයට බුද්ධත්වය හා සක්විති රජ යනු එසේ පහළ වන උත්තම පුරුෂයෝ දෙදෙනා වෙති. ලෞකික වශයෙන් මෙලොව පත්විය හැකි උපරිම තත්ත්වය චක්‍රවර්ති රජ හෙවත් සක්විති රාජ්‍ය සම්පත්තිය වේ. ආධ්‍යාත්මික ජීවිතයේ පත්විය හැකි උපරිම තත්ත්වය වන්නේ බුද්ධත්වයට පත්වීමයි. ඒ අනුව රජ යන්නට භාවිත වන පද දෙකක් පාලි සාහිත්‍යයේ දැකිය හැකිය. එනම් ඛත්තිය හා රාජ යන්නයි. ඛෙත්තානං අධිපතීති ඛො වාසෙට්ඨා ඛත්තියො (දී.නි. වාසෙට්ඨ සූත්‍රය 12); කෙතට අධිපති වූයේ

ක්‍ෂත්‍රිය නම් වෙයි. යන්න මෙහි අදහසයි. ඒ අනුව රජ ලෙස මුල් කාලීනව සලකන ලද්දේ කෙත්වතුවලට අධිපතිත්වය දැරූ පිරිසය. සමාජ ක්‍රමයේ ආරම්භය පිළිබඳ එන පැහැදිළි කිරීමේ දී මෙය ඉතා වැදගත් කරුණකි. කෙත්වලට අධිපති ලෙස රූපයෙන් යුත් ශරීරයෙන් පැහැපත් කෙනෙකු පත් කර ගැනීමට සෙසු සාමාජිකයන් ක්‍රියා කළ අතර පාලක පන්තියේ ආරම්භය ඒ ආකාරයට සිදු වූ බව දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය අවධාරණය කරයි. මහා සම්මත යනුවෙන් හැඳින්වූයේ ද එම පුද්ගලයාම බව උක්ත සූත්‍රය තව දුරටත් අවධාරණය කරයි. මහා සම්මත යන්න මෙහි දී විමසිය යුතු වදනකි. ප්‍රජාතන්ත්‍රවාදය ලෙස නූතන සමාජයේ ව්‍යවහාර වන බහුතර ජනයාගේ කැමැත්ත මෙයින් අදහස් කෙරේ. ඒ අනුව නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අදහස් සමාජ සම්භවය පිළිබඳ සාකච්ඡා වන දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් දැකිය හැකිය.

ධම්මෙනපරෙ රඤ්ජතීති ඛො වාසෙට්ඨා රාජා.... (දී.නි. වාසෙට්ඨ සූත්‍රය 12) මෙම ප්‍රකාශය ද වාසෙට්ඨ සූත්‍රය අවධාරණය කරයි. එයින් පැහැදිලි වන්නේ ධර්මයෙන් සෙසු ජනයා සුවපත් කරන්නා රාජ යනුවෙන් සම්මත කොට ඇති බවයි. මේ අනුව පාලකයා හැඳින්වීමට මූලික වශයෙන් මහාසම්මත, ඛත්තිය යන වදන් භාවිත වී ඇති අතර ඉන් පසුව රාජ යන නාමය භාවිත වී ඇත. එයද දිගින් දිගට ම ව්‍යවහාර වී ඇති අතර එහි උච්චතම සංවර්ධනීය ම අවස්ථාව චක්‍රවර්ති රාජ යන්නෙන් භාවිත වන බව ප්‍රකටය. රාජ යන සංකල්පයෙන් මහ ජනයන් පීඩාවට පත්වන අවස්ථා දුටු බුදුරජාණන් වහන්සේ සක්විති රජ කෙනෙකු ජනතාව අතරින් ම පත්කරලීමට අවශ්‍ය කරන උපදේශ චක්කවත්ති සීහනාද සූත්‍රය මගින් අවධාරණය කළහ.

රටක් පාලනය කරන්නා ගුණ සමුදායකින් යුක්ත පුද්ගලයෙක් විය යුතුය. තම ජනයා වෙනුවෙන් කාලය ධනය ශ්‍රමය පමණක් නොව ඥානය ද වැය කරන්නෙක් විය යුතුය. පාලක චරිතය තුළ තිබිය යුතු සුවිශේෂත්වය පෙන්වා දෙන බුදු දහම, රජු ආධ්‍යාත්මික ශික්‍ෂණයකින් යුක්ත කාර්ය ශූර අයෙක් විය යුතු බව අවධාරණය කරයි. පාලකයෝ සෑම අවස්ථාවකම තමාගේ යහපත ගැනම නොසිතිය යුතුය. පොදු මහ ජනයාගේ යහපත නිතර මෙනෙහි කළ යුතු ය. එම කැපවීම හා

පරාර්ථකාමීත්වය ඇති තැනැත්තා විශිෂ්ට පාලකයෙකු බවට පත් වෙයි. රජු මහා සම්මත විය යුතුයැයි අවධාරණය කර ඇත්තේ එබැවිණි. මේ ආකාරයේ ගුණයන්ගෙන් අනූන පුද්ගලයාම රටක් පාලනය කිරීමට සුදුසු වන්නේය.

බුද්ධ කාලය වන විට ඉන්දියාවේ පාලන ක්‍රම දෙකක් පැවති බව ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වේ. එම පාලන ක්‍රම දෙක බුදු දහමේ ඇගයීමට ලක්ව ඇත්තේ කුමන ආකාරයටද යන්න විමර්ශනය කිරීම මෙහි දී සිදු නොවේ. පර්යේෂණය බොහෝ දීර්ඝ වන බැවින් මෙන්ම මාතෘකාවට අදාළ නොවන බැවින් එය වෙනම මාතෘකාවක් ඔස්සේ සිදුවිය යුතු පර්යේෂණයකි. ඒ වෙනුවට බුදු දහමේ නිර්දිෂ්ට චක්කවත්ති රාජ සංකල්පය නූතනයේ බෙහෙවින් සාකච්ඡා වන යහපාලනය ගොඩ නැගීම සඳහා උපකාර කරගත හැකි වන්නේ කෙසේද යන්න මෙන් ම සක්විති රජු පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ තොරතුරු ඇතුලත් වී ඇති ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කෙරේ.

**පර්යේෂණ ගැටලුව**

මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව ලෙස සාකච්ඡා කෙරෙන්නේ චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය යහපත් රාජ්‍ය පාලනයක් සඳහා නූතන භාවිතාව පිණිස යොදා ගත හැකි ද යන්න විමර්ශනය කිරීමයි. එසේ ම සක්විති රාජ්‍ය සංකල්පය බොහෝ වාද විවාදයන්ට තුඩු දී ඇති ආකාරයත් ඒවායෙහි ඒකමතික බවත් තිබේද යන්න අධ්‍යයනය කිරීමත් මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස පෙන්වා දිය හැකිය.

**පර්යේෂණ අරමුණු**

චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය පිළිබඳ පවතින විවිධ සංකල්ප විචාරාත්මකව අධ්‍යයනය කිරීම හා එම සංකල්පය නූතන දේශපාලනික භාවිතාව සඳහා යොදා ගැනීමට ඇති හැකියාව සොයා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වෙයි. විශේෂයෙන් වර්තමානයේ ලෝකයේ බොහෝ රටවල සාකච්ඡා කෙරෙන යහපාලනය (Good governe) සඳහා යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීම මෙම පර්යේෂණයේ මූලික අපේක්ෂා අතර වෙයි.

## පර්යේෂණයේ වැදගත්කම

වර්තමාන ලෝකයේ විවිධ ආකාරයේ දේශපාලනික මතවාද සාකච්ඡාවට භාජනය වෙමින් පවතී. ලෝකය දේශපාලනික වශයෙන් විවිධ ගැටලුවලට මුහුණ දෙමින් පවතින අතර ඒවාට විසඳුම් වශයෙන් විවිධ සංකල්ප ඇතිවෙමින් ක්‍රියාත්මක වන ආකාරයක් දැකිය හැකි ය. මෙම පර්යේෂණය තුළින් මූලික වශයෙන් සාකච්ඡා කෙරෙන්නේ බුදු සමයේ ඉගගැන්වෙන චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය යහපාලනය සඳහා යොදා ගත හැකි ආකාරය පිළිබඳවයි. සක්විති රාජ සංකල්පය බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන රාජ්‍ය පාලන ක්‍රමයයි. එය පරමාදර්ශී වූවකි. රජකම හෝ පාලනය පියාගෙන් පුතුට උරුම වන්නක් නොවෙයි යන්න චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් වෙයි. (දීඝ නිකාය, චක්කවත්ති සීහනාද සූත්‍රය, 97 පිටුව, න පෙත්තිකං දායජ්ජං)

සුදුසුකම් ඇති අයෙක් ම රජ විය යුතුය. එසේ නොමැති වුවහොත් රටත් රාජ්‍යයත් පරිහානියට පත්වෙයි. සක්විති රජුගෙන් පසු රාජ්‍යය පාලනය හෙබවිය යුත්තේ සක්විති රජුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා ය. එහෙත් ඔහුට එයට සුදුසුකම් තිබිය යුතුය. සක්විති රජුගේ චක්‍රරත්නය අනුප්‍රවර්තනය කළ නොහැකි නම් ඔහු පුත්‍රයා වුවද රාජ්‍ය පාලනයට සුදුසු නොවේ.

මෙම පර්යේෂණයේ වැදගත්කම් ලෙස පෙන්වාදිය හැකි වනනේ නූතන දේශපාලන සංකල්පයක් වන යහපාලනය (Good governes) යන අදහස වඩාත් ප්‍රායෝගික කිරීමට බුදුදහමේ ඉගැන්වෙන පරමාදර්ශී රාජ්‍ය පාලන ක්‍රමය යොදා ගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යනය කිරීමයි. එසේ ම චක්‍රවර්ති රාජ්‍ය පාලන ක්‍රමය තුළ දැකිය හැකි නූතන ප්‍රජාතාන්ත්‍රික රාජ්‍ය පාලන ක්‍රම පිළිබඳ අවධානය යොමු කිරීම ද පර්යේෂණයේ වැදගත්කම ලෙස පෙන්වා දිය හැකිය.

## සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණයට අදාළව සාහිත්‍ය විමර්ෂණය විමසීමේදී ඉතාම ආන්දෝලනාත්මක මතයක් දක්වමින් විමර්ශනයක් සිදුකර ඇති මහාචාර්ය ඔලිවර් අබේනායකයන්ගේ බෞද්ධ අධ්‍යයන විමර්ශන නම් ලිපි එකතුව ඉතාමත් වැදගත් වේ. මහමිතව පඤ්ඤාරතන හිමි

සහ පහලගම ධම්මික යන හිමි වරුන් විසින් සංස්කරණය කර ඇති එම කෘතියේ 20 22 23 යන ලිපි මෙහිදී වැදගත් වෙයි. 20 වන ලිපියේ සඳහන් වන්නේ බුදු දහම හා සමූහාණ්ඩු (ගණතන්ත්‍ර) මිත්‍යාව යන මාතෘකාවයි. එහිදී ගණතන්ත්‍ර පාලන ක්‍රමය බුදුන් වහන්සේ අගය නොකළ බව එතුමා පිටකාගත සාධක පදනම් කරගෙන කරුණු දක්වා ඇත.

එම ග්‍රන්ථයේ 22 වන ලිපිය වන්නේ බුදුරජාණන් වහන්සේ සහ රාජාණ්ඩු ක්‍රමය යන මාතෘකාව බුදු සමයේ ඉගැන්වෙන රාජාණ්ඩු සංකල්පය පිළිබඳ අදහස් මෙම ලිපියේ දැකිය හැකිය. එහි චක්‍රවර්ති සංකල්පය පිළිබඳව ද තොරතුරු ඇතුළත්ව ඇති නමුත් චක්‍රවර්ති සංකල්පය උපයෝගී කර ගනිමින් යහපාලනයක් ගොඩනැගිය හැක්කේ කෙසේද යන්න පිළිබඳව සඳහන් නොවේ. රජ කෙනෙකු සතු විය යුතු ගුණාංග මෙන්ම රාජ ආණ්ඩු ක්‍රමයේ දී තීරණ ගැනීමේ පහසු බව එම ලිපිය තුළ බෙහෙවින් අවධාරණය කර තිබේ.

මහාචාර්ය ඔලිවර් අබේනායක මහතාගේ බෞද්ධ අධ්‍යයන විමර්ශන කෘතියේ 23 වන ලිපිය බෞද්ධ ධර්ම රාජ්‍ය හා පරමාදර්ශී සමාජය යන්නයි. එම පර්යේෂණය මගින් සක්විති රජු යනු කවුරුන් ද? ඔහුගේ සුවිශේෂත්වය කුමක් ද ? ඔහු සතුවන සුවිශේෂ බලපරාක්‍රමයන් මොනවාද? යන්න ආදිය මැනවින් විග්‍රහ කොට ඇත. එහෙත් එම සංකල්පය නූතන දේශපාලන ක්‍රමවේද හා ගලපා ගන්නා ආකාරය පැහැදිලි කොට නොමැත.

මහාචාර්ය මංගල ඉලංගසිංහ මහතා විසින් රචනා කරන ලද පෙරදිග දේශපාලන චින්තනය යන කෘතිය මෙම පර්යේෂණයට අදාළව සිදු කෙරී ඇති පූර්ව පර්යේෂණයක් ලෙස සැලකිය හැකිය. ඒ මහතා එම ග්‍රන්ථයේ දී දේශපාලන දෘෂ්ටිකෝණයෙන් රජු හා රාජ්‍ය සංකල්පය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබේ. බෞද්ධ ග්‍රන්ථවලට පමණක් සීමා නොවී භාරතීය සාහිත්‍යයේ දැකිය හැකි සුවිශේෂ ග්‍රන්ථ පදනම් කර ගෙන අදහස් ඉදිරිපත් කර ඇත. චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය පිළිබඳ මූලාශ්‍රයාගත විවරණයක් එහි ඇතුලත් වී ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කිරීම මගින් තොරතුරු ඒකරාශී කිරීම පර්යේෂණයේ මූලික ක්‍රමවේදය වෙයි. ග්‍රන්ථ සන්ධාර ක්‍රමයට අමතරව යහපාලනය හා චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය පිළිබඳ විද්වතුන් සමඟ සාකච්ඡා කොට තොරතුරු ඒකරාශී කිරීමේ ක්‍රමවේදය ද මෙම පර්යේෂණයේ දී යොදා ගැනේ.

**සාකච්ඡාව**

ලොව පහළ වන ආශ්චර්යවත් මිනිසුන් අතර පරමාදර්ශී රජු ලෙස සම්භාවනාවට පාත්‍රවන්නේ සක්විති රජතුමාය. මිනිසුන් පමණක් නොව දෙව්බඹුන්ගේ ද යහපත පිණිස ක්‍රියා කිරීම සක්විති රජුගේ පරම යුතුකම වේ. (දීඝනිකාය.ii-119 පිටුව) එම රජු සතු මූලික ලක්‍ෂණ දෙකකි. (අංගුත්තර නිකාය i, 76 පිටුව). එනම් එතුමා ආශ්චර්යවත් මනුෂ්‍යයෙකි. එසේම එතුමාගේ මරණය බොහෝ දෙනාගේ සන්තාපයට හේතු වේ. මෙම සුවිශේෂ ලක්‍ෂණ දෙකින් යුක්ත එතුමා සතු සුවිශේෂ ගුණයන් පහක් වේ. (අංගුත්තර නිකාය iii, 47 පිටුව). එනම්

1. අත්ථඤ්ඤූ
2. ධම්මඤ්ඤූ
3. මත්තඤ්ඤූ
4. කාලඤ්ඤූ
5. පරිසඤ්ඤූ වශයෙනි.

අත්ථඤ්ඤූ යනුවෙන් දක්වා ඇත්තේ අර්ථය මැනවින් දන්නා යන්නයි. එනම් සක්විති රජු හොඳ නරක මැනවින් හඳුනන හා හොඳ නරක හඳුනා ගැනීමේ සුවිශේෂ ලක්‍ෂණයකින් යුක්තය. පරිවාර ජනයාගේ ඇමැති මැතිවරුන් හෝ රජුගේ උපදේශකයන් කුමක් ප්‍රකාශ කළ ද ප්‍රකාශ කරන දෙයෙහි සත්‍ය අසත්‍යතාව සක්විති රජතුමා මැනවින් අවබෝධ කරගෙන සිටීමේ ගුණයෙන් යුක්තය. ඔහු

කිසිදු බලවේගයකට හෝ පිරිසකට පාලනය කළ නොහැකි චරිතයකි. පරමාදර්ශී බව ඔහුගේ චරිතයේ කැපී පෙනෙන සුවිශේෂ ලක්‍ෂණයකි. හොඳ නරක අවබෝධ කරගැනීමේ සුවිශේෂ ගුණයෙන් යුක්ත වීම රාජ්‍ය පාලනයේදී අතිශයින් වැදගත් වෙයි.

ධම්මඤ්ඤු යනු ද සක්විති රජ කෙනෙකු සතු තවත් සුවිශේෂ ගුණයකි. එනම් ධර්මය අධර්මය මැනවින් දන්නා බවයි. කිසිවිටෙකත් ධර්මය අභිබවා ක්‍රියා නොකිරීම සක්විති රජුගේ මූලික ලක්‍ෂණයයි. සක්විති රජුගේ ප්‍රධාන ගුරුවරයා ලෙස පිළිගන්නේ ධර්මයයි. ධර්මය මැනවින් දැන ක්‍රියා කරන නිසා චක්‍රවර්ති රාජ්‍ය පරමාදර්ශි ධර්ම රාජ්‍ය ලෙස සැලකෙයි.

මත්තඤ්ඤු යනුවෙන් හඳුන්වන්නේ සක්විති රජතුමා සතු තවත් සුවිශේෂ ලක්‍ෂණයකි. එනම් වරදට නිසි දඬුවම් දැන සිටීමයි. තමා අබිමුවට එන වරදකරුවන්ට දිය යුතු දඬුවම් පිළිබඳ මනාව දැන සිටිය යුතුය. වැරදිකරුවා වෙනුවෙන් පෙනී සිටින අය කොතරම් බලවන්ත හා පක්‍ෂග්‍රාහී වුවද සක්විති රජතුමා වරදට දියයුතු නියම දඬුවම අවබෝධ කරගෙන සිටියි. එය එම රජතුමාගේ සුවිශේෂී ලක්‍ෂණයකි.

කාලඤ්ඤු යනුවෙන් හඳුන්වන්නේ සක්විති රජතුමා සතු සුවිශේෂ ලක්‍ෂණයකි. එනම් කාලය හා අකාලය මැනවින් දන්නා යන්නයි. එනම් තම චර්යාව මැනැවින් කළමනාකරණය කරන්නේය යන්නයි. රාජකාරියට සුදුසු වෙලාව මැනවින් දන්නා මෙන් ම විනෝදයට සුදුසු වේලාව මැනවින් දන්නා යන අදහසයි. සංචාරයට සුදුසු ලොව අවබෝධ කරගෙන සිටින සක්විති රජතුමා විනෝදය පිණිස අවේලාවේ කිසි දිනෙක සංචාරය නොකරයි. එය සක්විති රජු සතු උදාර ලක්‍ෂණයකි.

පරිසඤ්ඤු යනු ද සක්විති රජතුමා සතු ගුණයකි. එනම් එදිනෙදා හමුවන පරිවාර ජනයා හෝ කිසියම් කෙනෙකු වේ ද ඒ සියලු දෙනාගේ ගතිගුණ මැනවින් දන්නේය යන්නයි.

රජ කෙනෙකු හෝ පාලකයෙකු යනු රටේ ප්‍රධානියා ය. ඔහුට දිනපතා වෙන්වූ චර්යා රටාවක් පවතී. එහිදී විවිධ තානාපතිවරු

මැති ඇමතිවරු තවත් රාජ්‍ය ප්‍රධානින් හමුවීම් බොහෝ ඇත. ඒ සෑම පුද්ගලයෙකුගේ ම ගතිපැවතුම් ආකල්ප චර්යා රටාවන් ආදී සියල්ලක්ම සක්විති රජතුමා මැනැවින් දනියි. එය සක්විති රජතුමා සතු සුවිශේෂ ලක්ෂණයකි.

වර්තමානයේ වුවද පාලකයන් තුළ මෙම ගුණධර්ම වර්ධනය වන අයුරින් තම චර්යාවන් ගොඩනගා ගැනීමට උත්සාහ ගන්නේ නම් යහපාලනය යන්න වදනකට පමණක් සීමා නොවන එකක් නොව යථාර්ථවාදී සංකල්පයක් බවට පත් කිරීමට හැකියාව පවතියි. නූතන පාලක පැලැන්තිය වෙතින් එවැනි අදහස් ඇති පුද්ගලයන් සොයා ගැනීම එතරම් පහසු කාර්යයක් නොවේ.

සක්විති රජතුමා හඳුනාගත හැකි වන්නේ ඔහු සතු මහාපුරුෂ ලක්ෂණයන්ගෙන්ය. (දීඝ නිකාය, ලක්ඛණ සුත්ත 237 පිටුව) එම රජතුමාට මහා පරිවාර සම්පත්තියක් පවතී. (දීඝ නිකාය iii. 147 පිටුව) එම පිරිවර අතර ඥාණයෙන් හා ගුණයෙන් යුක්ත යෞවනයන් පිරිසක් සිටීම සුවිශේෂ වෙයි. මීට අමතරව ප්‍රදේශාධිපතිවරුන් මැති ඇමැතිවරුන් ගැමියන් සිටුවරුන් ආදී සමාජයේ සිටින සෑම තරාතිරමකම අය සක්විති රජුගේ පරිවාර ජනයෝ වෙති.

සක්විති රජු යනු කාමභෝගී ජීවිතයේ අග්‍ර සැපය විඳින පුද්ගලයා ය. ඔහුට වඩා සැපවත් හා කිසිදු සම්පත්තියක් භුක්ති විඳින අයෙක් මෙලොව නැත. රසවත් ආහාර පාන ආදිය එතුමාට නිරන්තරයෙන් ලැබේ. (ලාභී හෝති පණීතානං රසිතානං ඛාදනීයානං භෝජනීයානං සායනීයානං ලෙහනීයානං පානානං (දිඝ නිකාය, iii, 151 පිටුව)

සක්විති රජතුමා සතුවන ඍද්ධි හතරක් පිළිබඳ සඳහන් වෙයි. එම ඍද්ධිය අතර ශාරීරික චමත්කාරය ප්‍රධාන වෙයි. (රාජා චක්කවත්ති අභිරූපො හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණ පොක්ඛරතාය සමන්නාගතො (දීඝනිකාය ii. 177 පිටුව) දැකුම්කළු සිත් ඇදගන්නා රූපය සක්විති රජුට ආභරණයක් බඳුය. රජතුමා සතුවන දෙවන ඍද්ධිය නම් දීර්ඝායුෂ්ක බවයි. (රාජා චක්කවත්ති දීඝායුකො හොති චිරට්ඨිතිකො. එම) සක්විති රජතුමා ආරක්ෂිතව දීර්ඝ කාලයක් ජීවත් වෙයි. මනුෂ්‍ය රූපයෙන් සිටින කිසිවෙකුට සක්විති රජතුමාට

හානියක් කළ නොහැකිය. එසේ ම සක්විති රජුගේ විශේෂත්වය වන්නේ එතුමාට රෝග පීඩාදිය ඇති නොවීම යි. (රාජා චක්කවත්ති අප්පාබාධො හොති අප්පාතංකො සමවෙපාකිණියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය. එම) දිව අග තබන ලද ආහාරයක රසය ශරීරය පුරා විහිද යන ආකාරයට රජතුමාගේ රස ඉන්ද්‍රිය පිහිටා ඇත. තව ද සක්විති රජ සතු තවත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ (රාජා චක්කවත්ති බ්‍රාහ්මණ ගහපතිකානං පියො හොති මනාපො. එම 178) ප්‍රාදේශීය රජවරුන්ට ආදර ගෞරව දැක්වීමයි. බ්‍රාහ්මණ ගෘහපතියන් ද රජුට එසේ ම ආදර ගෞරව දක්වයි. එය ද සක්විති රජතුමන් සතුවන සුවිශේෂී ලක්ෂණයක් වෙයි. මේ ආකාර ලක්ෂණවලින් යුක්ත වන සක්විති රාජ්‍ය පාලනය වෙනත් රාජ්‍ය පාලනයන්ගෙන් සුවිශේෂ වන්නේ ධාර්මික රාජ පාලනය හේතුවෙනි. වර්තමාන පාලකයන් තුළ දැකිය නොහැකි ලක්ෂණය වන්නේ මෙම ධාර්මිකත්වය යි. ධාර්මිකත්වය නැතිව කිසි ලෙසකින් හෝ යහපාලනය ගොඩ නැගිය නොහැකිය.

සක්විති රජතුමා තම ආධිපත්‍යය පවත්වා ගැනීම සඳහා පළමුවෙන් ම සිදු කරනු ලබන්නේ සියලු දෙනාට එකඟ විය හැකි පොදු දේශපාලනික ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීමයි. ඒ සඳහා ප්‍රාදේශීය රජවරුන්ගේ එකඟතාව නිරන්තරයෙන් ලබා ගනියි. ප්‍රාදේශීය රාජ්‍යයන් යුධ බලයෙන් යටපත් කිරීමෙන් තොරව ඔවුන් මිතුරන්සේ සලකා තම ප්‍රතිපත්ති සකස් කරනු ලබයි. කිසිවිටෙක එම ප්‍රතිපත්තිවලින් කිසිවෙකුටත් අගතියක් සිදු නොවේ. කවරෙකුගේ හෝ ද්වේශයට ලක් නොවෙයි. රාජ්‍යයේ සියලු ප්‍රදේශවල වසන ස්ත්‍රී පුරුෂ සියලු දෙනාටම ජීවිත ආරක්ෂාව තහවුරු කෙරෙයි. යටත් පිරිසෙයින් තිරිසන් සතුන්ට පවා සක්විති රාජ්‍ය ප්‍රතිපත්ති හමුවේ අගතියක් සිදු නොවේ. එසේ සියලු දෙනාට නීතිය පොදු වන අතර විශේෂ වරප්‍රසාද ලත් පිරිසක් සක්විති රාජ්‍යයේ නැත. සමස්ත රාජ්‍යයම සියලු රටවාසීන්ට අභය භූමියක් වැනිය. මිනිස් ජීවිතයේ ප්‍රමාණයට ම තිරිසන්ගත සත්ත්වයන්ගේ ජීවිත ආරක්ෂාවට ද කටයුතු සිදුවන්නේ සක්විති රාජ්‍යයක පමණි.

සදාචාරාත්මක සංකල්ප පිළිබඳ උපදෙස් ලබා ගැනීමට ආගමික නායකයන් විමසීම සක්විති රජුගේ තවත් සුවිශේෂ ලක්ෂණයකි. එහිදී ශ්‍රමණ බ්‍රාහ්මණ යන වදන භාවිත කොට ඇත. ශ්‍රමණ යනු සම්ප්‍රදායික

මතවාද විවේචනය කරමින් සිටි නව සම්ප්‍රදායකි. බ්‍රාහ්මණ යනු වෛදික උපනිෂද් ආදී යුගවල සිට පැවත එන ආගමික පිරිස් ය. මේ දෙපිරිසෙන් ම උපදෙස් ලබා ගැනීම සක්විති රජු විසින් සිදු කරනු ලබයි. යම් රටක සාම්ප්‍රදායික ආගමික නායකයන්ගෙන් ද ආගන්තුක ආගමිකයන්ගෙන් ද උපදෙස් ලබා ගැනීම අර්බුද අවම වීමට උපකාරී වෙයි. එය යහපාලනයක් ගොඩනැගීම පිණිස උපකාරී වන ප්‍රධාන ලක්ෂණයකි. එසේ ම ලබාදෙන උපදෙස්වලින් නරක ඉවත්කර වැදගත් දේ පමණක් ග්‍රහණය කර ගැනීමේ ශක්තිය පාලකයෙකු සතු විය යුතුය. සක්විති රජු එම ඥාණයෙන් යුක්ත අයෙකි.

සක්විති රාජ්‍යයක දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් ලෙස "රක්ඛාවරණ ගුත්ති" යන්න හැඳින්විය හැකිය. රාජ්‍යයක සුභසාධනය එමගින් සංකේතවත් කොට තිබේ. "රක්ඛා" නම් සැලකිලිමත් බවයි. පාලකයා තම පාලිතයන් පිළිබඳ මනා සැලකිල්ලක් දැක්විය යුතුය. ආවරණ නම් සෙවණය. පාලකයා රට වැසියනට ආවරණයක් හෝ සෙවණක් විය යුතුය. ගුත්ති නම් ආරක්ෂාවයි. පාලකයා තම වැසියාගේ ආරක්ෂාව තහවුරු කළ යුතුය. යුතුකම් හා අයිතිවාසිකම් තහවුරු කිරීම මෙම ප්‍රතිපත්තිය තුළ සිදු වෙයි. ඒ අනුව යුතුකම් ඉටුකිරීම තුළින් අයිතිවාසිකම් හිමිවන බව පැවසෙයි. මෙම සංකල්පය ද යහපාලනයක් ගොඩනැගීමට උපකාරී වෙයි.

සක්විති රජතුමාගේ කාර්යයක් වන්නේ ආහාර වස්ත්‍ර නිවාස විරැකියාව වැනි ප්‍රශ්න සතුටුදායක ලෙස විසඳීමයි. එපමණක් නොව සමාජයේ ජීවත්වන සියලු ස්ථරවල වැසියන්ට අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම රජුගේ කාර්යයක් ලෙස සලකයි. පාලකයන් සදාචාර සම්පන්න ශික්ෂාකාමී පිරිසක් වීම හේතුකොටගෙන එකී රාජ්‍යයේ වැසියෝ ද ශික්ෂාකාමී සදාචාරාත්මක පිරිසක් බවට පත් වෙති. එවැනි සමාජයක අධාර්මික ක්‍රියාවන් නැත. චක්‍රවර්ති ව්‍රතයට අනුවද සිදු කෙරෙන අනුශාසනයක් වන්නේ රාජ්‍යය තුළ අධාර්මික ක්‍රියා සිදු නොවිය යුතු බවයි. (දීඝ නිකාය iii. 78 පිටුව) යහපාලනයක් ගොඩනැගීමට මෙම සංකල්පය ද මහෝපකාරී වෙයි.

සක්විති රජතුමා තම ප්‍රාදේශීය පාලකයන්ට අනුශාසනා සිදු කරයි. එනම් ප්‍රාණඝාතයෙන් වලකින්න. සොරකම් කිරීමෙන්

වලකින්න. කාමයෙහි වරදවා හැසිරීමෙන් වලකින්න. බොරු කීමෙන් වලකින්න. සුරා පානයෙන් වලකින්න ආදී වශයෙනි. එනම් තමන් පන්සිල් ආරක්ෂා කරමින් අන් අයද පන්සිල් ආරක්ෂා කරවන පිරිසක් බවට පත්කිරීමයි. පන්සිල් ආරක්ෂා කරන සමාජයක අධාර්මික ක්‍රියාවන්වලට ඉඩක් නැත. එවැනි සමාජයක යහපාලනය නිතැතින්ම ගොඩනැගේ.

ගෘහ ජීවිතය ආරක්ෂා කිරීමත් පෞද්ගලික දේපල ආරක්ෂා කිරීමත් රාජ්‍යයක් සතු පරම වගකීමකි. යමෙක් යම් වැරදි ක්‍රියාවක් සිදු කරයි ද ඔහුට දඬුවම් දීමට පාලකයා පසුබට නොවිය යුතු ය. සක්විති රාජ්‍යයක වුවද එම ස්වභාවය දැකිය හැකිය. වැරදි නොකරන ආකාරයට ජනයා පෙළඹවීම පාලකයාගේ වගකීමක් බව චක්කවත්ති සීහනාද සූත්‍රය සඳහන් කරයි. (දීඝ නිකාය iii, 65 පිටුව)

සක්විති රජතුමා සතු වන තවත් ලක්ෂණයක් වන්නේ දක්ෂ භාණ්ඩාගාරිකයෙකු සතු වීමයි. ස්වාභාවික සම්පත් මනා ලෙස පාලනය කරමින් අසම්බාධිත ආදායම් මාර්ග ඇති එකී ඇමතිවරයා රාජ්‍යයේ ධනය සම්බන්ධ සියලු කාර්යයන් සිදු කරනු ලබයි. එම නිසාම එකී රාජ්‍ය සශ්‍රීකත්වයෙන් පිරුණු රාජ්‍යයක් බවට පත්වෙයි. එම නිසාම මා හට අයබදු මගින් රැස්කරගත් මහ ධනස්කන්ධයක් ඇතැයි ප්‍රීතියට පත්වන සක්විති රජතුමා ඒ පිළිබඳ උදම් අනන බව පැවසෙයි. (අලං හො මම්පි පහුතං සාපතෙය්‍යං ධම්මිකෙන බලිකෙන අභිසංඛතං. දීඝනිකාය ii. 180 පිටුව)

**සමාලෝචනය**

ඉහත සඳහන් වූ කරුණු සමාලෝචනය කර දැක්වීමේ දී සක්විති රාජ්‍යයක දැකිය හැකි සුවිශේෂි ලක්ෂණ මෙසේ දැක්විය හැකිය.

- තිරිසන් සතුන් ඇතුළුව රටවැසියන් සියල්ලන්ටම නිදහසේ සීමට රැකවරණය සැලසීම.
- රටතුළ සිදුවන විවිධාකාර අපරාධ නවත්වා සාමය පවත්වාගෙන යෑම.

- මනා සැලසුම් සහගත ආර්ථික ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

- නිශ්චිත ආගමික හා සංස්කෘතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

- අත්තනෝමතික නොවී විශේෂඥ උපදෙස් ඇතිව ජනතා අදහස්වලට සවන් දී පාලන කටයුතු කිරීම. මෙම කරුණු සක්විති රාජ්‍ය සංකල්පය තුළ දැකිය හැකිය.

යහපාලනය (Good governශ) යනුවෙන් වර්තමානයේ සාකච්ඡාවට ගැනෙන මෙම සංකල්පය ගොඩනැගීම සඳහා ඉහත දක්වන ලද සංකල්ප බොහෝ සෙයින් උපකාරී කර ගත හැකි ආකාරය මේ අනුව පෙන්වා දිය හැකිය. සක්විති රාජ්‍යයේ දැක්වෙන දස සක්විති වත් මෙම ලිපියේ දී දක්වා නැති අතර එම වත්වල ඇති අන්තර්ගතය පමණක් විමසා ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අංගුත්තර නිකාය i, ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය නැදිමාල, 2005.

දීඝ නිකාය i, ii, iii කාණ්ඩ, ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය නැදිමාල, 2005.

දීඝ නිකාය අට්ඨකථා (සංස්), ධම්මකිත්ති සිරි ධම්මානන්ද හිමි හේ. මු ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ, 1923

මජ්ඣිම නිකාය ii, ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය නැදිමාල, 2005.

අබේනායක, ඔලිවර් , බෞද්ධ අධ්‍යයන විමර්ශන සංස්. මහමිතව පඤ්ඤාරතන හිමි, පහලගම ධම්මික හිමි. විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මරදාන පාර පුංචි බොරැල්ල, 2009.

කොස්වත්තේ අරියවිමල හිමි, විවරණ සංස්. මහමිතව පඤ්ඤාරතන හිමි, රත්මල්කැටියේ සමිත හිමි. මාගධී පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය මිරිස්වත්ත. 2009.